නිපුණතාව 07 - මුදල් හා මිල මට්ටම්වල හැසිරීම හඳුනාගනිමින් ආර්ථිකයේ ක්‍රියාකාරීත්වයට බැංකු පද්ධතිය දායක වන ආකාරය විමර්ශනය කරයි.

නිපුණතා මට්ටම 7.6 - ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණු හා කාර්ය විමසයි.

- ශ්‍රී ලංකා ආර්ථිකයේ මූල්‍ය ප්‍රතිපත්ති මෙහෙයවීම මූල්‍ය කටයුතු සඳහා උපදේශනය,ආර්ථික හා මිල ස්ථායීතාව සහ මූල්‍ය ක්‍රමයේ ස්ථායීතාව පවත්වා ගෙන යාම සඳහා පිහිටවූ ස්වාධීන ආයතනය මහ බැංකුවයි.
- මහ බැංකුවේ වත්මන් අරමුණු දෙකකි.
  1.ආර්ථික හා මිල ස්ථායීතාව පවත්වා ගෙන යාම.
  2.මූල්‍ය ක්‍රමයේ ස්ථායීතාව පවත්වා ගෙන යාම.

**<u>ආර්ථික හා මිල ස්ථායීතාව -</u>** අඩු උද්ධමන වේගයක් කරා ළඟා වීමට මූල්‍ය ප්‍රතිපත්ති සකස් කිරීමයි.

**<u>ආර්ථික හා මිල ස්ථායීතාව වැදගත් වීමට හේතු -</u>**

1.ආර්ථික වර්ධනය ප්‍රවර්ධනය කිරීම.
2.කාර්යක්ෂම ලෙස සම්පත් බෙදා වෙන් කිරීම.
3.නිෂ්පාදකයන්,පාරිභෝගිකයන් හා ආයෝජකයන්ගේ අවදානම අඩු කිරීම.
4.ආර්ථික සැලසුම් සකස් කිරීම.

**<u>මූල්‍ය ක්‍රමයේ ස්ථායීතාව -</u>**

ආර්ථික,මූල්‍ය,දේශපාලන හා වෙනත් කවර ම හෝ ක්ෂේත්‍රයක පැන නගින අභ්‍යන්තර හෝ බාහිර හෝ කම්පනයන් හමුවේ නොසැලී සිටීමේ හැකියාව මූල්‍ය ක්‍රමයේ ස්ථායීතාවයි.

**<u>අභ්‍යාස</u>**

1.මහ බැංකුවේ කාර්යයන් මොනවාද?

2.මූල්‍ය ප්‍රතිපත්ති යනු කුමක්ද?

3.වර්තමාන මූල්‍ය ප්‍රතිපත්ති රාමුවේ ප්‍රධාන අරමුණු මොනවාද?